සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

- ✳ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ✳ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ✳ සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** **සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) රස නිෂ්පත්තිය සඳහා ප්‍රධාන වන ස්ථායි භාව සංඛ්‍යාව .................. කි.

(ii) ග්‍රහපංති කවි විශේෂය ගායනා කරනු ලබන්නේ .................. ශාන්තිකර්මයේ දී ය.

(iii) ප්‍රාසංගික බව තීව්‍ර කිරීමට යොදා ගන්නා රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ ...................... අභිනයට ය.

(iv) මාත්‍රා 2 + 2 + 3 තාල රූපය හඳුන්වන්නේ .................. තිතේ ප්‍රභේදයක් ලෙසිනි.

(v) 14 වන සියවසේ දෙවිනුවර උපුල්වන් දේවාලයේ, දේවදාසින් පිළිබඳ ව දේශාටන වාර්තා සටහනක් තබන ලද පුද්ගලයා වන්නේ, ................................................... ය.

(vi) රුප්පා යකුන් පිදීම හා මෙලෙයි යකුන් පිදීම යන චාරිත්‍ර විධි අයත් වන්නේ ............................. ශාන්තිකර්මයට ය.

(vii) වෙන්ඩාව හා වෙංගිලම් වාද්‍ය භාණ්ඩ දෙක භාවිත කරනුයේ ......................... නර්තන සම්ප්‍රදායට ය.

(viii) කුඹි කතාව මුද්‍රා නාට්‍යයේ රංග රචනය කරන ලද්දේ ............................. විසිනි.

(ix) කරදිය මුද්‍රා නාට්‍යයේ සංගීත නිර්මාණය සහ නර්තන නිර්මාණය කළ ශිල්පීන් **දෙදෙනා** නම් කරන්න.

(අ) සංගීත නිර්මාණය :- ......................................

(ආ) නර්තන නිර්මාණය :- ......................................

(x) හිරෝෂිමා සහ භාව චලන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ප්‍රවීණ කලාකරුවන් **දෙදෙනා** කවුරුන් ද?

(අ) හිරෝෂිමා :- ......................................

(ආ) භාව චලන :- ......................................

WWW.OLEVELAPI.COM

**2.** පහත දැක්වෙන බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(i) ✳ දොං ජිං ජිං තකට දොංතක

✳ ගුංද ගතිගත ගත්ත ගුදිගුඳ

✳ කුඳත් තක්කිට තකට ජිමිතකු

(ii) පහත දැක්වෙන කවි පද, මාත්‍රා තුනේ තනි තිතට ප්‍රස්තාර කරන්න.

"අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්
ගත පිට බඳ සොලවා සිලි සිලි නද කරමින්"

(iii) මාත්‍රා 3 + 4 තාලයට අයත් අඩව්වක්/ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) හේවිසි වාදනය

(ii) සතර අභිනය

(iii) වජිරා චිත්‍රසේන

(iv) ටීකා සීපද

(v) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය

[අටවැනි පිටුව බලන්න.


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

4. ශාන්තිකර්මවලට ආවේණික වූ ගායන, නාට්‍යමය පෙළපාළි සහ ඇඳුම් පැළඳුම්වලින් ඒවායේ සමාජ පසුබිම පිළිබඳ ව තොරතුරු විවරණය කෙරේ.
   (i) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාළි **හතරක්** නම් කරන්න.
   (ii) සබරගමු පහන් මඩුවේ ගායන සහිත නර්තනාංග **දෙකක්** පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.
   (iii) පහතරට දෙවොල් මඩුව ශාන්තිකර්මයේ එන කතාපුවතින් සමාජ විවරණය කෙරෙන ආකාරය සාකච්ඡා කරන්න.

5. (i) සොකරි ගැමි නාටකයේ පුද ලබන දෙවිවරු **දෙදෙනෙක්** හා ප්‍රචලිත ප්‍රදේශ **දෙකක්** නම් කරන්න.
   (ii) සොකරි සහ කෝලම් නාටකයන්හි රංගවස්ත්‍රාභරණවල වෙනස්කම් **දෙකක්** වෙන්කොට දක්වන්න.
   (iii) කෝලම් නාටකයෙහි එන මානුෂ චරිතයක් නිරූපණයේ දී සිදුවන සමාජ ශෝධනය පිළිබඳ ව විචාරයට ලක් කරන්න.

6. ශ්‍රී ලාංකේය නර්තන කලාව ආගමික, සමාජීය හා අධ්‍යාපනික වශයෙන් වඩාත් සංවර්ධනය වී ඇති බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.
   (i) 1970න් පසු නර්තන කලාවේ අධ්‍යාපනික සංවර්ධනයට විශේෂ වූ කරුණු **හතරක්** ලියන්න.
   (ii) නර්තන කලාවට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ ව මහා වංශයේ සාධක **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.
   (iii) මහනුවර යුගයේ දී නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ ව ආගමික සහ සමාජීය පසුබිම සම්බන්ධ කරුණු **දෙකක්** යටතේ විමසුමට ලක් කරන්න.


7. පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

   (i) **A** රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම්වලින් යහපත් දිවි පෙවෙතකට ලැබෙන පිටිවහල පිළිබඳ ව කරුණු **හතරක්** ලියා දක්වන්න.
   (ii) **B** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායෙහි භාවිත වන අවනද්ධ භාණ්ඩයක් හා තත් භාණ්ඩයක් නම් කර ඉන් එකක් පිළිබඳ ව විස්තරයක් කරන්න.
   (iii) **C** රූපයේ දැක්වෙන ප්‍රාසංගික කලාංග නිර්මාණකරණයේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ ව විමසුමක් කරන්න.

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...